# ලේඛනයේ ආරම්භය සහ පුස්කොළ පොත් ලේඛන කලාව පිළිබඳ විමසුමක්

- ආර්. එම්. රෝහන රත්නායක

## හැඳින්වීම

අතීතයේ සිට ම මිනිසා තම දැනුම සටහන් කිරීම සඳහා විවිධ මාදිලියේ ලේඛන මාධ්‍යයන් භාවිත කළ බව පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික මූලාශ්‍රයන් මගින් තහවුරු වේ. ඒ සඳහා යොදාගත් අමුද්‍රව්‍යයන් පිළිබඳව ද විවිධ පර්යේෂණ සිදු වී තිබේ. ලේඛනය උදෙසා බූර්ජ පොතු, (Birch – bark) කපුරෙදි, දැව පුවරු, උණ පතුරු, සත්ව හම්, ඇත්දත් පුවරු, ලෝහ තහඩු, ගඩොල්, වළං, පුස්කොළ යනාදී[1] අමුද්‍රව්‍ය යොදාගෙන ඇති බව වියතුන්ගේ පිළිගැනීමයි. මෙසේ ලිවීම සඳහා භාවිත කළ පැරණි මාධ්‍යයන් අතර ශාකමය ද්‍රව්‍යයන්ට හිමිවූයේ සුවිශේෂී ස්ථානයකි. ගස්වල පොතු සහ කොළ මේ සඳහා යොදාගෙන ඇත. එයිනුදු ගස්වල පත්‍ර සඳහා විශේෂත්වයක් හිමි වේ. විවිධ ගණයේ කොළවල අක්ෂර ලේඛන ගත කළ බවට ප්‍රමාණවත් සාහිත්‍යය තොරතුරු තිබේ. ඒ අතර උක්කොළ (Euahorbia), හල්කොළ, (Vetaria acuminate), වැටකෙයියා කොළ (Pandanus odoratissawus) වැනි කොළවල පමණක් නොව කුඩා කාලයෙහි වැලිපිල්ලේ අකුරු හුරුවන බාලයන් විසින් නෙළුම් කොළවල හා කෙසෙල් කොළවල ද අකුරු පිටපත් කර තිබේ.[2] හුදෙක් මෙවැනි කොළ භාවිත කර ඇත්තේ ලේඛනය පුහුණුවීම සඳහා හෝ නොවටිනා ග්‍රන්ථ රචනා කිරීම සඳහා විය හැකිය.[3] ලේඛනය උදෙසා තාල වර්ගයට අයත් ගස්වලින් සිදුවන්නේ අපරිමිත මෙහෙයකි. ඉන්දියාව (India), ශ්‍රී ලංකාව (Sri Lanka), බුරුමය (Myanmar), සියමය (Thailand), කාම්බෝජය (Cambodia) හා ලාඕසය (Lao) යන රටවල් ලේඛනය සඳහා වර්ග දෙකකට අයත් තාල වර්ගයේ ගස් භාවිත කර ඇත.[4]

1. Palmyra Palm – Borassus Flabellifera (තල් කොළ)
2. Talipot Palm – Corypha umbraculifera (තල කොළ)

යන වර්ග දෙකයි.[5]

තල කොළවලට සාපේක්ෂව තල් කොළවල අධික සීතලට සහ උෂ්ණත්වයට ඔරොත්තු දීමේ ගුණය පහළ මට්ටමක ඇති අතර කල් පැවැත්ම ද අඩුය. දකුණු ඉන්දියාවෙහි ඇතැම් ප්‍රදේශවල සහ ලංකාවේ උතුරු ප්‍රදේශයෙහි තල් කොළ ලේඛන සඳහා වැඩි වශයෙන් භාවිත කර ඇත. නමුත් ඉන්දියාවේ හා ලංකාවෙහි සෙසු ප්‍රදේශවල තල කොළ ලේඛන කටයුතු සඳහා යොදා ගෙන තිබේ. තල් කොළ ලේඛන කලාව සඳහා යොදාගෙන ඇත්තේ බොහොමයක් ලිපි, සටහන් සහ පණිවිඩ සඳහාය. වැදගත් ආගමික හෝ රාජ්‍ය තාන්ත්‍රික ග්‍රන්ථ සඳහා තල්පත් භාවිත කොට නොමැත.[6] බෙහෙත් වට්ටෝරු, බඩු ලැයිස්තු, ලියුම්, පණිවිඩ, නැකැත්, කෙටි සටහන්, කවි පබැඳුම් වැනි තාවකාලික දෛනික කෘත්‍යයන් සඳහා තල්පත් යොදාගෙන ඇත. එසේ නැතහොත් වටිනාකමින් හා වැදගත් කමින් අල්ප කුඩා ප්‍රමාණයේ පොත් රචනා කිරීම සඳහා යොදාගෙන ඇත.[7] නමුත් වැදගත් ආගමික හා රාජ්‍ය තාන්ත්‍රික ග්‍රන්ථ හා ලේඛන සඳහා තල කොළ භාවිත කොට තිබේ. ඉංග්‍රීසියෙහි “Palm leaf manuscript”[8] යන්නෙන් පුස්කොළ ලේඛන හඳුන්වනු ලබන අතර තල් හෝ තල වැනි කොළවල අතින් ලිවීම යනු එහි අදහසයි. “ Manuscript ” යන්න ලතින් වචනයකි. "manuscriptus", literally "written by hand."[9] යනු එහි අදහසයි.

## පුස්කොළ ලේඛනය

ඉන්දියාව ප්‍රමුඛ ආසියාතික රටවල ප්‍රාග් ඓතිහාසික යුගයෙහි පටන් මිනිසා පිච්චූ මැටි බඳුන්, ගල් පුවරු වැනි ද්‍රව්‍ය ලේඛනය සඳහා යොදා ගත් අතර පසුකාලීනව ක්‍රමයෙන් සත්ව හන්, සිළික් රෙදි, ගස්වල පොතු, පට්ට හා තාල වර්ගයට අයත් කොළ භාවිත කළ බව Royed සඳහන් කරයි.[10] කේරලයෙහි හම් වැනි කඩදාසි (parchment paper) සහ තල් කොළ අතීතයෙහි භාවිත කළ බව Van Rheede ඔහුගේ “Hortus Malabaricus” කෘතියෙහි පෙන්වා දී ඇත.[11] ඉන්දියාවෙහි පුස්කොළ පොත් ලේඛන කලාවෙහි ආරම්භය කලියුගය දක්වා දිවයයි. ගංගා නම් නදිය සමීපයෙහි ජීවත් වූ පාණිනී නම් ඍෂිවරයා මීට වර්ෂ 4161 පෙර එනම් 790 වන කලියුග වර්ෂයෙහි පුස්කොළ

භාවිත කළ බව Fergusson සඳහන් කරයි.[12] පුස්කොළ පොත් ලේඛන කලාව දකුණු ඉන්දියාවෙහි කේරළයෙහි ප්‍රධාන ලේඛන මාධ්‍යය විය.[13] දකුණු ආසියාව හා අග්නි දිග ආසියාවට අයත් නේපාලය, ලංකාව, තායිලන්තය, මියන්මාරය, ඉන්දුනීසියාව සහ කාම්බෝජියාව යන රටවල මෙය ප්‍රධාන ලේඛන මාධ්‍යයක් ලෙස ව්‍යාප්ත විය.[14] නමුත් මෙහි ආරම්භය කුමන කාලයක සිදු වූවා ද යන්න නිශ්චිතව ප්‍රකාශ කළ නොහැක. රිචඩ් සොලමන්ගේ අදහස වන්නේ අශෝක යුගයට පෙර පටන් ලේඛන කලාවක් පැවති බවත් එහි දී පුස්කොළ, ගස් පොතු සහ රෙදි යොදාගත් අතර අයහපත් පාරිසරික සාධක මත ඒවා විනාශයට පත් වූ බවයි.[15]

ක්‍රි. ව. 1824 දී බ්‍රිතාන්‍ය ජාතික Mr. Brian Hodgson විසින් කාලය සඳහන් නොමැති ඉතා පැරණි බෞද්ධ සංස්කෘත පුස්කොළ පොත් 381 නේපාලයෙන් සොයා ගන්නා ලද අතර පසුව යුරෝපය ප්‍රමුඛ විවිධ රටවල වියතුන්ගේ ප්‍රයෝජනය සඳහා බෙදා හරිනු ලැබ ඇත.[16] මහායාන බුදු දහම හා සම්බන්ධ සංස්කෘත පුස්කොළ පොත් විශාල ප්‍රමාණයක් නේපාලයෙහි රචනා වූ අතර පසු කාලීනව ලංකාව, මියන්මාරය, තායිලන්තය යනාදී රටවලට ද ව්‍යාප්ත වී ඇත. දහසය වන සියවසෙන් පසුව ලිවීමට සහ චිත්‍ර ඇඳීම සඳහා නේපාල වැසියන් 'තාද පත්‍ර' හෙවත් පුස්කොළ භාවිත කර තිබේ.[17] නෛතික කටයුතු සඳහා පමණක් 'තාමසුක්ස්' නමින් හැඳින්වෙන පුස්කොළ භාවිත කළ බවත් එම වර්ගයට අයත් ක්‍රි. ව. 1334 දී පමණ රචිත ඉතා පැරණි පුස්කොළ පොතක් පිළිබඳව සඳහන් වේ.[18]

### ලේඛක සහ ලේඛා

මහා බ්‍රහ්ම ක්‍රි. ව. 580 දී පමණ ඔහුගේ එක් අතකින් පුස්කොළ මිටියක් ගෙන බදාමිහි දී දක්නට ලැබුණු බව බ්‍රාහ්මණ හා ජෛන ග්‍රන්ථවල සඳහන් වේ.[19] බුදු දහමෙහි ද නොයෙක් අවස්ථාවල ලේඛන කලාව හා සම්බන්ධ තොරතුරු දක්නට ඇත. අංගුත්තර නිකායෙහි තික නිපාතයෙහි ක්‍රෝධය පිළිබඳව දේශනා කිරීමේ දී 'පාසාණෙ ලෙඛා ඛිප්පං න ලුප්ජති පඨවියා ලෙඛා .... උදකෙ ලෙඛා ...' ගල්වල ලිවීම පොළවෙහි ලිවීම හා දිය මත ලිවීම යනාදී වශයෙන් තෙවැදෑරුම් ලේඛන විධීන් දක්වා තිබේ.[20] එසේම මැදුම් සඟි අටුවාවෙහි ද සිලා ලේඛන කලාව බුද්ධ කාලයෙහි පවා පැවති බවට

තොරතුරු සඳහන් වේ.[21] තුන්වන ධර්ම සංගායනාවේ දී සකවාද හා පරවාද විස්තර කොට කථාවත්ථුප්‍රකරණය ලේඛනාරූඪ කළ බව ධම්මසංගනියෙහි වාර්තා කොට ඇත.[22] මහාවග්ගපාලියෙහි සඳහන් 'ඉණ පණ්ණ' හා 'පොත්ථක' යන වචන දෙක රාජ නියෝග ලේඛනවල දී භාවිත වී ඇත. මෙහි 'පණ්ණ' යන්නෙන් කොළ හා පත්‍ර ද 'පොත්ථක'[23] යන්නෙන් පුස්කොළ පොත් ද අදහස් කළා විය හැකිය. පාරාජික පාලියෙහි සියදිවි නසා ගැනීම සම්බන්ධ ශික්ෂාපදයෙහි 'සියදිවි නසා ගැනීම වාචිකව හෝ ලිඛිතව භික්ෂූන් සඳහන් නොකළ යුතුය' යන විනය නීතියට අර්ථ දක්වන බුද්ධඝෝෂ හිමියන් වාචිකව හා තල්පත් ආදියෙහි[24] (තාල පණ්ණාදීසු ලිඛිත්වා) ලියා ප්‍රකාශ නොකළ යුතුයි යනුවෙන් කංඛාවිතරණී විනය අටුවාවෙහි විස්තර කරයි. මෙයින් පැහැදිලි වන්නේ බුද්ධ කාලයෙහි පුස්කොළ භාවිතය පිළිබඳව බුද්ධඝෝෂ හිමියන්ට යම් අවබෝධයක් තිබුණු බවයි. භික්ෂු භික්ෂුණී පාචිත්‍යවල එන 'ලේඛක' හා 'ලේඛා'[25] යන වචනවලින් ද බුද්ධ කාලය වනවිට යම් ලේඛන කලාවක් පැවති බව තහවුරු වේ. බෞද්ධ පිටක ග්‍රන්ථ වැනි විශාල සාහිත්‍යයක් කාලයක් පවත්වාගෙන ඒමට ද එය පිටුවහලක් වන්නට ඇත.

හත් වන සියවසයෙහි මුළු ඉන්දියාවෙහි ම පුස්කොළ භාවිත කළ බව හ්‍යුං ෂියැං සඳහන් කරයි. මුල් ඓතිහාසික අවධියේ සිට ම පුස්කොළ භාවිත කළ බව ක්‍රි. ව. 6 වන සියවසට අයත් 'හොරිවුෂි' හා 4 වන සියවසට අයත් 'ගොඩ්ෆ්‍රේ' එකතුවේ පුස්කොළවලින් තහවුරු වේ. නේපාලය, ජපානය හා නැගෙනහිර තුර්කිස්ථානය යන රටවලින් සොයාගන්නා ලද අත්පිටපත් ඉන්දියාවේ පැරණිම අත් අකුරුවලින් රචිත පුස්කොළ පිටපත් ලෙස සැලකේ.[26] මහමදිකයන් විසින් ඉන්දියාවට කඩදාසි හඳුන්වා දීමෙන් පසු ක්‍රි. ව. 1233 දී මුල් ම අත් අකුරු පොත රචනා කරන ලදි. වාචනා මාර්ගයෙන් පවත්වාගෙන පැමිණි දැනුම පොත්වල ලියා ආරක්ෂා කිරීමට ඉන්දියානුවන් ගත් උත්සාහය භාණ නම් මහා කවියා සතුව පැවති පුස්තකාලයෙන් හා භෝජ රජු සතුව පැවති ප්‍රසිද්ධ පුස්තකාලයෙන් මනාව පැහැදිලි වෙයි.

## ලක්දිව ලේඛනයේ ආරම්භය හා විකාශය පිළිබඳ තොරතුරු

ලක්දිව ලේඛන කලාව පිළිබඳව ක්‍රි. පූ. 6 වෙනි සියවසයෙහි සිට ම වංශකථාවල සඳහන් වේ. මහාවංසයෙහි සඳහන් වන ආකාරයට

විජය රජු හා පඬි රජු අතරත් විජය රජු හා සුමිත්ත කුමරු අතරත් ලිපි හුවමාරු වී තිබේ.[27] උත්තිය කුමරු සිය නෑනාට ලිපියක් යැවූ බවත්, මිහිඳු හිමියන්ගේ උපදෙසින් දේවානම් පියතිස්ස රජු ගල් කණුවක හා රන්පතක විස්තර ලියා තැන්පත් කළ බවත් මහාවංසයෙහි සඳහන් වේ.[28] ඉහත සෑම අවස්ථාවක දී ම 'ලෙඛං' යන වචනය සඳහන් වුවත් එය කවර නම් ලේඛනයක් ද යන්න සඳහන් නොවේ. නමුත් සිලාස්ථම්භ හා සුවණ්ණපට්ට යන වචන දෙක මිහිඳු හිමියන් හා දේවානම්පියතිස්ස රජු සම්බන්ධ සිදුවීමෙහි දී මහාවංසය දක්වා ඇත. මෙයින් පැහැදිලි වන්නේ වැදගත් සිද්ධීන් වාර්තා කිරීම සඳහා බොහෝ කාලයක් පවතින ද්‍රව්‍ය ද අනිකුත් ලේඛන කටයුතු සඳහා තල් කොළ වැනි අමුද්‍රව්‍ය ද භාවිත කර ඇති බවයි.

මහාබෝධිවංශයෙහි 'ජගති මහාලාන' හා 'ජය මහාලාන' යන තනතුරු දෙකක් දක්නට ඇත.[29] ජය සිරි මහ බෝධිය ලංකාවට වැඩම වීමෙන් පසු ඒ සඳහා කටයුතු කළ පිරිසට මෙම තනතුරු ප්‍රධානය කර තිබේ. එහි දී බෝධි ගුප්ත කුමරුට 'ලංකා ජගති මහාලානො' තනතුරත් සුමිත්ත කුමරුට 'ජය මහාලානො' යන තනතුරත් ලැබී ඇත. මෙම තනතුරු දෙක එකල රාජ්‍ය පරිපාලනය හා සම්බන්ධ ප්‍රධාන ලේකම් තනතුරුය. බ්‍රාහ්මීය ලෙන් ලිපිවල පරුමුකවරුන් දැරූ 'ගණක' හා 'කණපේඩික' නම් තනතුරු දෙකක් ඇත.[30] කණපෙඩික යනු විස්තර ලියා සුරක්ෂිතව තබන්නාය. ගණක යනු ගණකාධිකාරීවරයාය. මෙයින් පැහැදිලි වන්නේ එම යුගයෙහි පවා ලේඛනාරක්‍ෂණ කටයුතු සිදු වූ බවය. එසේ ම මෙම ලේඛන පුස්කොළ වැනි කොළ විශේෂයක් විය හැකියැයි අනුමාන කළ හැකිය. තව ද ක්‍රි. පූ. තුන් වෙනි සියවසයෙහි පමණ රචනා වන පූර්ව බ්‍රාහ්මීය ශිලා ලේඛනවල 'ලපන' (ලිවීම හෙවත් ඇඳීම) 'චිතකර' (සිතුවම්කරු) 'අචරිය' (ගුරුවරයා) 'වෙඣ' (වෛද්‍යවරයා) 'හවිය' (කවියා) 'නකති' (ජ්‍යෝතිර්වේදියා) 'වොහාර' (නීතිවේදියා)[31] යනාදී සමාජයෙහි පිළිගත් වෘත්තීයවේදීන් පිළිබඳව සඳහන් වේ. මුල් යුගයෙහි සිට ම මෙම වෘත්තීය වේදීන් ලේඛනය සඳහා පුස්කොළ යොදා ගන්නට ඇතැයි සිතිය හැකිය.

මිහිඳු හිමියන්ගේ ලංකාගමනයත් සමග ලක්දිව ලේඛන කලාව දියුණුවට පත්වූ බව නොරහසකි. හෙළ අටුවා සාහිත්‍ය එයට කදිම නිදසුනකි. මගධ බසින් තිබූ අටුවා හෙළ ඇඳුරෝ හෙළ බසට නැගූහ.[32]

අවසන් වරට හෙළ අටුවා පිළිබඳව පොළොන්නරු යුගයෙහි ජීවත් වූ ශාරිපුත්‍ර සංඝරාජ හිමියන් විසින් රචනා කරන ලද සාරත්ථදීපනීයෙහි සඳහන් වේ.[33] එ වැනි සුවිසල් සාහිත්‍යක් වාචනා මාර්ගයෙන් පවත්වාගෙන ඒම පහසු කාර්යයක් නො වූ බැවින් පුස්කොළවල ලියා පවත්වාගෙන එන්නට ඇත. ඈත අතීතයේ සිට ම ලක්දිව තල් කොළ වැනි කොළ වර්ග ලේඛනය සඳහා යොදා ගත් බවට විනය පිටකයට අයත් පරිවාර පාලිය කදිම නිදසුනකි. ලක්දිව විසූ දීප නම් තෙරුන් විසින් පසුකාලයක පරිවාර පාලිය රචනා කොට විනය පිටකයට එකතු කළ බව ග්‍රන්ථාවසානයෙහි දක්වයි.[34] සමන්තපාසාදිකාවේ පාචිත්‍ය වර්ණනාවෙහි 'මෘදු ඉන්දසාල' හා 'නුහි' වැනි ගස්වල කඳන්වල හා එම ගස්වල හටගත් තල කොළ ආදී කොළවල ගසේ තිබියදී අකුරු ලිවීම භික්ෂුව පාචිත්‍ය ඇවතකට පත්වීමට හේතුවක් බව සඳහන් වේ.[35] අතීතයෙහි සිට තල් කොළ හා තල කොළ හා සමාන වෙනත් කොළ වර්ග මෙන්ම විවිධ ගස්වල කඳන් ලේඛන මාධ්‍යක් ලෙස භාවිත කළ බව තහවුරු වෙයි. උත්තිය කුමරු කැලණියෙහි රජ කළ කල්‍යාණතිස්ස රජුගේ බිසවට භික්ෂුවක් අතෙහි ලිපියක් යැවූ බව මහාවංසයෙහි වාර්තා වේ.[36]

ක්‍රි. ව. දහ වන සියවසය වන විට තල් ගස් කැපීම සම්පූර්ණයෙන් ම තහනම් කර තිබූ බව මිහිඳු රජුගේ මිහින්තලේ පුවරු ලිපියෙහි හා උදාමයහා සෙනෙවියාගේ පුලියම්කුලම පුවරු ලිපියෙහි සඳහන් වේ.[37] තව ද තල් ගස් සොරුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ගස් වටේ කටු බැඳීම හා ලීවලින් සාදන ලද වඳුරෙකු එහි බැඳ උඟට පහර දීම කළ බව බුද්ධඝෝෂ තෙරුන් සමන්තපාසාදිකාවෙහි දක්වා ඇත.[38] එම යුගයෙහි තල් ගස ප්‍රයෝජනවත් වෘක්ෂයක් ලෙස ආරක්ෂා කළ බවත් ඒ සඳහා සමාජයෙහි වටිනාකමක් පැවති බවත් මෙයින් පැහැදිලි වේ. ක්‍රි. පූ. තුන් වන සියවසයෙහි පැවති තල් උයනක් සම්බන්ධව විසුද්ධිමාර්ගයෙහි දක්නට ලැබේ.[39] බුද්ධදත්ත තෙරුන් ලක්දිව සිට ඉන්දියාවට නැවත යන අවස්ථාවෙහි බුද්ධඝෝෂ තෙරුන් මුහුද මැද දී හමු වූ බව බුද්ධඝෝසුප්පත්තියෙහි සඳහන් වන අතර එම අවස්ථාවෙහි බුද්ධඝෝෂ හිමියන්ට අරළු ගෙඩියක් හා පන්හිඳක් ලබා දී ශරීරයෙහි යම් අපහසුතාවක් ඇති වූ අවස්ථාවක එය ගල ගා පානය කරන ලෙසත් එසේ ම තමන්ට නිම කිරීමට නොහැකි වූ

හෙළ අටුවා පාලියට නගන ලෙසත් ඉල්ලා ඇත.[40] මෙහි බුද්ධඝෝෂ හිමියන්ට පන්හිඳක් ලබාදීම පිළිබඳ වාර්තාවෙන් පැහැදිලි වන්නේ මෙම අටුවාචාරීන් වහන්සේලා දෙදෙනාම තම ලේඛන කටයුතු සඳහා තල කොළ භාවිත කළ බවයි. තලපත් හැඳින්වීම සඳහා ''තාලපණ්ණ" යන වචනය පැරණි කෘතිවල යොදාගෙන තිබේ. පණ්ණ යන්නෙන් පොදුවේ කොළ වර්ග අර්ථකථනය වූ නමුත් තාල පණ්ණ යන්නෙන් ග්‍රන්ථ රචනා කිරීම සඳහා යොදා ගත් තලපත් පමණක් හඳුන්වා ඇත. එයට හේතු වන්නට ඇත්තේ එම යුගයෙහි සිලාස්ථම්භ, රන්පත් හා කොළ වර්ග ඒ සඳහා යොදා ගැනීමයි.[41]

වෝහාරික තිස්ස රජු 'ගන්ථ පණ්ණික පාසාද' නමින් ගොඩනැගිල්ලක් ඉදිකළ බව මහාවංසයෙහි තිස් හය වන පරිච්ඡේදයෙහි සඳහන් වේ.[42] 'ගන්ථ පණ්ණික' යන වචනයෙන් පැහැදිලි වන්නේ පොත් සඳහා පිළියෙළ කරන ලද පුස්කොළ තැන්පත් කර තිබූ ස්ථානයයි. බුද්ධඝෝෂ හිමියන් පසු කාලයෙහි මෙහි වැඩ සිටිමින් ත්‍රිපිටකය හදාරා පධානඝරයෙහි සිට අටුවා ලියූ බව මහාවංසය පෙන්වා දෙයි.[43]

ලක්දිව පාලනය කළ ඇතැම් රජවරු රාජ්‍ය පාලනයට අමතරව පොත් පත් රචනා කළ බව ඓතිහාසික මූලාශ්‍රවලින් අනාවරණය වේ. බුද්ධදාස රජු විසින් දේශීය වෛද්‍ය විද්‍යාව සම්බන්ධව ලියන ලද සාරාර්ථ සංග්‍රහය (ක්‍රි. ව. 340 - 368), කුමාර ධාතුසේන රජු සංස්කෘත භාෂාවෙන් රචිත ජානකීහරණය, (ක්‍රි. ව. 512 - 520), දෙවන මුගලන් රජුගේ ධර්ම කාව්‍ය ග්‍රන්ථය, (ක්‍රි. ව. 535 - 555) පළමු දප්පුල රජුගේ නඩු තීන්දුව, (ක්‍රි. ව. 659), පළමු සේන රජුගේ සියබස්ලකර කාව්‍යාලංකාර ග්‍රන්ථය, (ක්‍රි. ව. 833 - 853) පස්වන කාශ්‍යප රජුගේ ධම්පියා අටුවා ගැටපද සන්නය, අභිධර්ම ව්‍යාඛ්‍යානය හා බුද්ධස්තෝත්‍ර යන කෘති ද, (ක්‍රි. ව. 914 - 923), පළමු විජයබාහු රජුගේ ධම්මසංගිණී අනුවාදය ද, (ක්‍රි. ව. 1055 - 1100), පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ කව්සිළුමිණ, විනය විනිශ්චය සන්නය හා විසුද්ධිමාර්ග සන්නය (ක්‍රි. ව. 1236 - 1270) යන ග්‍රන්ථ ඉන් කිහිපයකි.[44] මෙම කෘතීන් බොහෝමයක් වර්තමානයෙහි දක්නට නොලැබුණත් මේ සෑම කෘතියක් ම පුස්කොළ පොත්වල රචනා කර තිබී ඇති බව දැනට ශේෂව පවතින පුස්කොළ පොත්වලින් පැහැදිලි වේ.

## සමාලෝචනය

ඉහත සඳහන් ඓතිහාසික, පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යාත්මක තොරතුරුවලින් පැහැදිලි වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයෙහි සිට ම ඉන්දියාව ඇතුළු ආසියාතික රටවල පැහැදිලි ලේඛන කලාවක් පැවති බවයි. එසේ ම එය විවිධ ලේඛන මාධ්‍යයන් මගින් දියුණුවට පත් වී වර්තමානය දක්වා පැමිණ ඇත. එහි දී ක්‍රිස්තු පූර්ව හය වන සියවසයෙහි සිට ම පුස්කොළ පොත් ලේඛන කලාව පැවති බව ඉහත කරුණුවලින් සනාථ වේ. ලක්දිව පුස්කොළ පොත් ලේඛන කලාව මහින්දාගමනයත් සමගින් දියුණුවෙන් දියුණුවට පත් වූ බව බුදු දහම මූලික කොට ගෙන රචනා වී ඇති විශාල ග්‍රන්ථ සාහිත්‍ය තුළින් මනාව පැහැදිලි වෙයි. ක්‍රි. ව. 19 වන සියවස දක්වා ලක්දිව පුස්කොළ ලේඛන කලාව අඛණ්ඩව පැවති අතර වර්තමානයෙහි ද ඉතා සුළු වශයෙන් ඇතැම් ප්‍රදේශවල දක්නට ලැබේ. ක්‍රි. ව. 1737 දී ලන්දේසීන් මුද්‍රණ යන්ත්‍ර හඳුන්වාදීමත් සමග පුස්කොළ පොත් ලේඛන කලාව ක්‍රමක්‍රමයෙන් අභාවයට පත්වීම ආරම්භ විය.

## ආන්තික සටහන්

1. Gunaratne, M. 2006, p. 1.
2. Trimen, H. 1895, p. 151.
3. Gunaratne, M. 2006, p. 3.
4. Gunaratne, M. 2006, p. 1.
5. Udaya Kumar. D. 2009, p. 1.
6. Silva, de W.A. 1938, p. xiii.
7. Silva, de WA. 1938, p. xiii.
8. https://en.wikipedia.org/wiki/Palm-leaf_manuscript.
9. http://www.oxfordlearnersdictionaries.com/definition/english/manuscript?q=manuscript .
10. Royel, J.E. 1855.
11. Padmakumar, P.K & Sreekumar, V. B. 2003, p. 126.
12. Fergusson, W. 1888.
13. Padmakumar, P.K & Sreekumar, V. B. 2003, p. 126.
14. Agrawal, 1984, p. 24.
15. Saloman, 1998 p. 14-15.

16. http://www.dsbcproject.org/manuscripts/short-history.
17. http://www.dsbcproject.org/manuscripts/short-history.
18. http://www.dsbcproject.org/manuscripts/short-history.
19. Buhler, JG. 1904, p. 1.
20. Morris, R. 1961. අංගුත්තරනිකාය වෙ. 1. පි. 283.
21. 'සිලායං ලෙඛා විය' Woods, J.H. 1928. පපඤ්චසුදනී. වෙ. 2. පි. 252.
22. 'තං වාචනා මග්ගතො පොත්ථකෙ ලිඛිතං' PTS. ධම්මසංගනී. පි. 8.
23. 'රාජා ච නං පණ්ණෙ වා පොත්ථකෙ වා' PTS. සමන්තපාසාදිකා. වෙ. 5. පි. 998.
24. කඞ්ඛාවිතරණී නාම මාතිකට්ඨකථා. 1930 පි. 30.
25. Oldenberg, H. 1993. පාචිත්‍යපාලි වෙ. 4. පි. 8.
26. ආරිය ලගමුව, 2006, පි. 59.
27. පණ්ණාකාරෙ ච ලෙඛඤ්ච, මහාවංසය. පරි. 7 ගා. 51, 57. ලෙඛං දත්වාන විජයො, 8 පරි. ගා. 3.
28. උස්සාපෙසි සිලාථම්භං තං පවත්තිං ලිඛාපිය, මහාවංසය. පරි. 15 ගා. 173.
29. පාලි බෝධිවංසය.101 පි.
30. Paranavitana, S. 1970. p. 97.
31. Paranavitana, S. 1970. p. 97.
32. පපඤ්චසූදනී, පි. 1.
33. කුලසූරිය, ආනන්ද, 1992, පි. 28.
34. දීපනාමො මහාපඤ්ඤො සුතධාරී විචක්ඛනො' පරිවාරපාලිය 2006, පි. 313.
35. සමන්තපාසාදිකා, පි. 765.
36. මහාවංසය. පරි. 22. ගා. 17.
37. EZ. Vol. 1. Pp. 87, 185.
38. සමන්තපාසාදිකා. පි. 559.
39. විසුද්ධිමග්ග. 1914. පි. 184.
40. BG. 1892. P. 50.
41. සමන්තපාසාදිකා. පි. 765.
42. මහාවංසය. පරි. 36. ගා. 232, 233.
43. මහාවංසය. 1912. පරි. 37. ගා. 227, 230.
44. ආරිය ලගමුව, 2006. පි. 71.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. ආරිය ලගමුව, 2006. ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව, අතුරුගිරිය.
2. ඒකනායක, යූ. ජී. 1950. සමන්තපාසාදිකා, කොළඹ.
3. බු. ජ. ත්‍රි ග්‍රන්ථමාලා 6. 2006. පරිවාරපාලි.
4. සයිමන් හේවාවිතාරණ, 1930. කඞ්ඛාවිතරණී නාම මාතිකට්ඨකථා. කොළඹ.
5. සයිමන් හේවාවිතාරණ, 1943. පපඤ්චසූදනීනාම මජ්ඣිමනිකායට්ඨකථා. කොළඹ.
6. හික්කඩුවේ සුමංගල හිමි, බටුවන්තුඩාවේ පඬිතුමා, 1912. මහාවංසය. කොළඹ.
7. Agrawal, 1984. Conservation of Manuscripts and Paintings of South-east Asia. London.
8. D. Udaya Kumar, G.V. Sreekumar, U.A. Athvankar, 2009. Traditional writing system in Southern India – Palm leaf manuscripts. Kerale, India.
9. Dyke Y.V. 2009. The Conservation and Exhibition of Early Buddhist Manuscripts on Palm Leaves.
10. Fergusson, W. 1888. Description of the palmyra palm of Ceylon. Observer Press. Colombo.
11. Mahendra Gunaratne, 2006. Manuscript writing on palm-leaves. LL.
12. Morris, R. 1961. Papañcasūdanī. PTS. London.
13. Oldenberg, H. 1993. Pācittiya pāli. PTS, Oxford.
14. Padmakumar, P.K. & V.B. Sreekumar, 2003. Palm Leaves as Writing Material History and Methods of Processing in Kerala. Kerala, India.
15. Paranavitana. S. 1970. Inscrition of Ceylon, Vol. I pt. 1 Early Brahmi Inscriptions. Colombo.
16. PTS, 1904-1912. Epigraphia Zeylanica Vol. 1. Oxford.
17. Royle, J.F. 1855. The fibrous plants of India fitted for cordage, clothing and paper with an account of the cultivation and preservation of flax, hemp, and their substitutes. London.
18. Silva de, W.A. 1938. Catalogue of Palm Leaf Manuscripts. Colombo.
19. Soloman, Richaid. 1998. Indian Epigraphy. New Delhi.